WWW.OLEVELAPI.COM

සියලු ම හිමිකම් ඇවිරිණි / முழுப் பதிப்புரிமையுடையது /All Rights Reserved]

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
இலங்கைப் பரீட்சைத் திணைக்களம்
Department of Examinations, Sri Lanka

15 S I, II

අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගය, 2024(2025)
கல்விப் பொதுத் தராதரப் பத்திர (சாதாரண தர)ப் பரீட்சை, 2024(2025)
General Certificate of Education (Ord. Level) Examination, 2024(2025)

ක්‍රිස්තියානි ධර්මය	**I, II**
கிறிஸ்தவம்	**I, II**
Christianity	**I, II**

ක්‍රිස්තියානි ධර්මය II

* **පළමුවැනි** ප්‍රශ්නය හා තවත් ප්‍රශ්න **හතරක්** ඇතුළුව ප්‍රශ්න **පහකට** පමණක් පිළිතුරු සපයන්න.
* පළමුවැනි ප්‍රශ්නයට ලකුණු **20** ක් ද තෝරා ගන්නා අනෙක් ප්‍රශ්නයකට ලකුණු **10** බැගින් ද හිමි වේ.

1. (i) (අ) ජේසුස් වහන්සේව කුරුසියේ ඇණගැසීමට තීරණය ලබාදුන්නේ කවුරුන් විසින් ද?

(ආ) ජනතාව ජේසුස් වහන්සේ වෙනුවට නිදහස් කිරීමට තෝරාගත් පුද්ගලයා කවුරුන් ද?

(ii) ජේසුස් වහන්සේ පාවා දුන්නේ කවුරුන් ද? ඒ සඳහා ඔහු උපයෝගී කරගත් ක්‍රමවේදය කුමක් ද?

(iii) (අ) දෙවියන් වහන්සේ උදාර වූ සිංහාසනයක් මත වැඩ සිටින බව දර්ශනයකින් දුටු දිවැසිවරයා කවුරුන් ද?

(ආ) එම දිවැසිවරයා තම කැඳවීමට මුලින්ම දක්වූ ප්‍රතිචාර අතුරෙන් **එකක්** සඳහන් කරන්න.

(iv) ලාසරස් හා ධනවතාගේ ජීවන තත්ත්වයන් පෙන්නුම් කරන කරුණු **එක** බැගින් වෙන වෙන ම ලියන්න.

(v) (අ) ත්‍රෝවසයේදී සිදු වූ ප්‍රාතිහාර්යය කුමක් ද?

(ආ) එම ප්‍රාතිහාර්යය සිදු කරන ලද්දේ කවුරුන් විසින් ද?

(vi) "මුළු ඉශ්‍රායෙල් ජනතාව අතරවත් මෙතරම් ශ්‍රද්ධාවක් මා දැක නැත."

(අ) ජේසුස් වහන්සේ මෙසේ පැවසුවේ කවර පුද්ගලයෙකු පිළිබඳව ද?

(ආ) මෙමගින් දේව රාජ්‍යයේ කුමන ගුණාංගයක් ඉස්මතු කෙරේ ද?

(vii) මුල් කිතුනු සභාවේ 'සහභාගිකම' පෙන්නුම් කරන ලක්ෂණ **දෙකක්** ලියන්න.

(viii) තම කිතුනුකම රැකගෙන සමාජය තුළ සහජීවනය ඇතිකළ හැකි ආකාර **දෙකක්** සඳහන් කරන්න.

(ix) (අ) 'නාඳුනන දෙවියන්ට' යන පූජාසනය, පාවුල්තුමාට දැනගන්නට ලැබුණු නගරය කුමක් ද?

(ආ) එම නගරයේ වැසියන් ආමන්ත්‍රණය කිරීමට පාවුල්තුමා උපයෝගී කරගත් ක්‍රමෝපායවලින් **එකක්** සඳහන් කරන්න.

(x) වර්ණභේදවාදයට එරෙහිව ජීවිතය පරදුවට තබමින් සේවය කළ නායකයන් **දෙදෙනෙකු** සඳහන් කරන්න.

2. (i) (අ) සීසර් අධිරාජ්‍යයාට බදු ගෙවීම පිළිබඳ ප්‍රශ්නය නැගුවේ කවුරුන් ද?

(ආ) එයට ප්‍රතිචාර දැක්වීමට උපයෝගී කරගත් කාසිය කුමක් ද?

(ii) ජේසුස් වහන්සේව විටින් විට විවේචනයට හා අභියෝගයට ලක් කළ යුදෙව් ආගමික කණ්ඩායම් **තුනක්** සඳහන් කරන්න.

(iii) "සීසර්ගේ දේ සීසර්ටත් දෙවියන් වහන්සේගේ දේ දෙවියන් වහන්සේටත් දෙන්න." යන ප්‍රකාශය තුළින් වත්මන් කිතුනු සමාජයට ලබාදිය හැකි ආදර්ශ **පහක්** ලියා, ඉන් **එකක්** ක්‍රියාවට නැංවිය හැකි ආකාරය කෙටියෙන් විස්තර කරන්න.

[හත්වැනි පිටුව බලන්න.

අ.පො.ස සාමාන්‍ය පෙළ සියලුම විෂය ධාරාවන්ට අදාල ප්‍රශ්න පත්‍ර/පිළිතුරු පත්‍ර/සටහන් හා තවත් බොහෝ දෑ ලබාගැනීමට පිවිසෙන්න www.olevelapi.com වෙත ...

3. (i) ආත්මයාණන් වහන්සේගේ මඟපෙන්වීම යටතේ ජීවත්වන පුද්ගලයෙකු ලෙස ඔබ විඳහා දක්වන හැසිරීම් රටා **දෙකක්** සඳහන් කරන්න.

(ii) ආත්මයාණන් වහන්සේගේ මගපෙන්වීමෙන් බැහැරව කටයුතු කරන අයගේ ජීවිත තුළ දක්නට ලැබෙන ලක්ෂණ **තුනක්** ලියන්න.

(iii) ඔබගේ මිතුරන් වර්තමාන සමාජය තුළ මුහුණ දෙන අභියෝග **පහක්** සඳහන් කොට, ඉන් **එක්** අභියෝගයකින් මිදීම සඳහා ඔබට උපකාර කළ හැකි ආකාරය කෙටියෙන් පැහැදිලි කරන්න.

4. (i) (අ) මිසරයේ වහල්බවින් පීඩා විඳි සෙනඟ මොරගැසුවේ කාට ද?

(ආ) ඔවුන්ව වහල්බවින් මුදවා ගැනීම පිණිස යැවිවේ කවුරුන් ද?

(ii) ඉශ්‍රායෙල් ජනයා මිසරයේදී පීඩා විඳීමට හේතු වූ කරුණු **තුනක්** ලියන්න.

(iii) වර්තමාන සමාජය තුළ අපට දකින්නට හා අසන්නට ලැබෙන හිංසන හා පීඩිත තත්ත්වයන් **පහක්** සඳහන් කොට, ඉන් **එකකට** ඔබ යෝජනා කරන පිළියම් කවරේ දැයි කෙටියෙන් පැහැදිලි කරන්න.

5. (i) ආමොස් දිවැසිවර සේවයේ යෙදෙන්නට පෙර ඔහු යෙදී සිටි වෘත්තීන් **දෙකක්** ලියා දක්වන්න.

(ii) ආමොස් ජීවත් වූ සමාජය තුළ පැවති අසාධාරණ අයුක්ති සහගත ක්‍රියාකාරකම් **තුනක්** සඳහන් කරන්න.

(iii) අද සමාජය තුළ මෙවැනි අසාධාරණකම් හමුවේ, කිතුනු අපට ගතහැකි ක්‍රියාමාර්ග **පහක්** කෙටියෙන් විස්තර කරන්න.

6. (i) සාවුල් (පාවුල්) හා බාර්ණබස් උපන් නගර වෙන් වෙන් ව ලියන්න.

(ii) (අ) බාර්ණබස් සිරියාවේ අන්තියෝකියේ සභාවට පැමිණි විට එම සභාවේ වර්ධනය කෙබඳු වී තිබුණි ද?

(ආ) අන්තියෝකි සභාවේ වර්ධනය හමුවේ බාර්ණබස් දැක් වූ ප්‍රතිචාරය කුමක් ද?

(ඉ) සාවුල් සහ බාර්ණබස් ධර්මදූත සේවයට පිටත්කර යැවීමට ප්‍රථම ඔවුන්ට ශක්තිය ලබාදුන්නේ කෙසේ ද?

(iii) පළමු ධර්මදූත මෙහෙවර මුල්කරගෙන, වර්තමාන සමාජය තුළ කෙරෙන මෙහෙවරයන්හිදී කිතුනු අපට අනුගමනය කළ හැකි ධනාත්මක උපක්‍රම **පහක්** උදාහරණ දෙමින් කෙටියෙන් විස්තර කරන්න.

7. පහත සඳහන් මාතෘකා අතුරෙන් **දෙකක්** තෝරා ගෙන ඒ සඳහා දී ඇති උපදෙස් වාක්‍ය භාවිත කරමින් කෙටි සටහන් ලියන්න.

(i) විනිශ්චය හා කුරුසියේ මරණය

- පේසුස් වහන්සේට එල්ල වූ චෝදනා
- පේසුස් වහන්සේව විනිශ්චය කළ පුද්ගලයන් හා කණ්ඩායම්
- පේසුස් වහන්සේගේ දුක්විඳීම හා මරණය සිදු වූ ආකාරය
- පේසුස්, වහන්සේ විනිශ්චයේදී කළ ප්‍රකාශන හා කුරුසිය වටා සිටි අයවලුන් පේසුස් වහන්සේ වෙත යොමු කළ කියමන්
- සාධාරණ විනිශ්චයක් හා යහපත් මරණයක් බලාපොරොත්තුවීම

(ii) දිවැස් වැකි

- දිවැස් වැකි යනු
- කිතු උපත පිළිබඳ දිවැස් වැකි
- ඒවායේ දක්නට ලැබෙන විශේෂ ගුණාංග
- කිතුනු උපත සිදු වූ කාලය තුළ දක්නට ලැබෙන සමාජ තත්ත්වය
- වර්තමාන සමාජයේ දිවැසිවර කාර්යය හඳුනාගැනීම

WWW.OLEVELAPI.COM

[අටවැනි පිටුව බලන්න.

අ.පො.ස සාමාන්‍ය පෙළ සියලුම විෂය ධාරාවන්ට අදාල ප්‍රශ්න පත්‍ර/පිළිතුරු පත්‍ර/සටහන් හා තවත් බොහෝ දෑ ලබාගැනීමට පිවිසෙන්න www.olevelapi.com වෙත ...

(iii) සමාවදීම

– ජේසුස් වහන්සේ සමාවදීම සම්බන්ධයෙන් ඉගැන්වූ අවස්ථාවන්

– සමාවදීම පිළිබඳ ජේසුස් වහන්සේගේ විශේෂ පණිවුඩය

– සමාවදීම යන්න ඉගැන්වීමක් පමණක් නොව, ජේසුස් වහන්සේගේ ක්‍රියාවන් තුළින් ද දැකිය හැකි වූවකි.

– සමාවදීමෙන් ජේසුස් වහන්සේ පෙන්නුම් කළ දෙවියන් වහන්සේ පිළිබඳ පණිවුඩය

– සමාවදීමේ වැදගත්කම හා එය ජීවිත ආදර්ශයෙන් පෙන්නුම් කළ කිතුනුවන්

(iv) ලෞකික හා ආත්මික දිළිඳුකම

– ජේසුස් වහන්සේ ජීවත් වූ සමාජයේ දක්නට තිබූ සමාජ තරාතිරම්

– ධනවත් පුද්ගලයින් හා ධනය පිළිබඳ ජේසුස් වහන්සේගේ ඉගැන්වීම්

– දේව රාජ්‍යයට ධනය බාධාවක් වන්නේ ය.

– දේව රාජ්‍යය හා අප අතර බාධක ඇත්නම් ජේසුස් වහන්සේට අනුව විවිධ ක්‍රියාමාර්ග ගත යුතු ය.

– වර්තමානයේ දිළිඳුකම අවබෝධ කරගැනීම හා අවශ්‍ය ලෙස එයට ප්‍රතිචාර දැක්වීම

* * *

WWW.OLEVELAPI.COM

අ.පො.ස සාමාන්‍ය පෙළ සියලුම විෂය ධාරාවන්ට අදාල ප්‍රශ්න පත්‍ර/පිළිතුරු පත්‍ර/සටහන් හා තවත් බොහෝ දෑ ලබාගැනීමට පිවිසෙන්න www.olevelapi.com වෙත ...